State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

# G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

# අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

## (GEOGRAPHY)

## භූගෝල විද්‍යාව

# (QUESTION PAPER) - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

**භූගෝල විද්‍යාව - I**

**අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - **එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 යි.**

- **1 සිට 05 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. අභ්‍යවකාශයේ සිට පෘථිවියට දෙසට පතිත වන උල්කාශ්ම බොයෝමයක් සැවී විනාශ වන්නේ .............. ගෝලයේදීය.

   (පරිවර්ති / අපරිවර්ති / මෙසෝ / තාප)

2. කොවිඩ් - 19 ( Covid - 19 ) වෛරසය මූලාරම්භ වූ වූහාන් නගරය පිහිටා ඇති භූ තැටිය ................... වේ.

   (යුරේසියානු භූ තැටිය / ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය / නැස්කා භූ තැටිය/ අප්‍රිකානු භූ තැටිය )

3. ශ්‍රී ලංකාවේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති වී පර්යේෂණායතනය ....................පිහිටා ඇත.

   (මහඉලුප්පල්ම / බතලගොඩ / හිඟුරක්ගොඩ / බෝඹුවල )

4. ශ්‍රී ලංකා 1: 50000 භූ ලක්ෂණ සිතියම් නිර්මාණය සඳහා ................ ප්‍රක්ශේපනය පදනම් කර ගෙන ඇත.

   (මෝල්වයිඩ් / කේතු / බොන් / මර්කේටර් )

5. 1(50000 භූ ලක්ෂණ සිතියමක වර්ග ප්‍රමාණය 4cm$^2$ කින් නිරූපිත සැබෑ භූමියේ විශාලත්වය .............. කි.

   ( වර්ග කිලෝමීටර 1 / වර්ග සෙන්ටිමීටර 1 / වර්ග කිලෝමීටර 4 / වර්ග සෙන්ටිමීටර 4)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

6. අර්ධ වශයෙන් දිරාපත් වූ ලවණ වර්ග සහ මැටි වර්ග B මහලෙහි තැන්පත් වී ඇත .
   ( නි/වැ)

7. ආසියානු ප්‍රදේශයේ බහුතරයකගේ ප්‍රධාන ආහාරය තිරිඟු යි.
   ( නි/වැ)

8. ශ්‍රී ලංකාවේ මාරවිල ප්‍රදේශය මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.
   ( නි/වැ)

9. ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගන්නේ වෙරළාසන්න ධීවර කර්මාන්තයෙනි.
   ( නි/වැ)

10. පෘථිවි ප්‍රාවරණයට පෘථිවි ස්කන්ධයෙන් 1/3 ක් පමණ අයත් ය.
    ( නි/වැ)

- **අංක 11 සිට 18 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න**

11. උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් පහල බසී. එය ........................................................ නමින් හැඳින්වේ.


12. සුපර් සොනික් ජෙට් යානා ගමන කරන්නේ ............................................ ගෝලය තුළය.

13. ලෝකයේ විශාලතම විල ලෙස ............................................ විල හැඳින්විය හැක.

14. ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳව මුල්ම අදහසක් ඉදිරිපත් කරනු ලැබුවේ ග්‍රීක ජාතික............................................ විසිනි.

15. තෙත් කලාපයට අවේනික, තේ,රබර්,කෝපි, කෝපි, කරඳමුංගු, කරාබුනැටි, හා පලතුරු වැනි වගාවන්ට සුදුසු පස ...................................................පස වේ.

- **අංක 16 සිට 18 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කරගන්න**




ඉහත ප්‍රස්තාරයට අනුව

16. වැඩිම නිෂ්පාදන ප්‍රමාණයක් කර ඇත්තේ .......................................... වර්ෂවලදීය.

17. අඩුම වී අස්වැන්නක් ලබා ඇත්තේ .................................................................... වර්ෂවලදීය.

18. ආසන්න වශයෙන් 2010/11 වර්ෂවලදි වගා කර ඇති බිම් ප්‍රමාණය ...................................................... වේ.

**අංක 19 සිට 22 තෙක් දි ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුපිළිවෙළට අනුව 'ආ' තිරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

19.

| 'අ' | 'ආ' |
|---|---|
| 1 විල් ජලය | A. 8 % |
| 2 පාංශු ජලය | B. 52 % |
| 3 ජල වාෂ්ප | C. 1 % |
| | D. 38 % |

(1)ACB (2) BAD (3) BDA (4) ACB (..........)

20. 'අ' 'ආ'

1 තස්මේනියා දූපත් A. උතුරු ඇමරිකානු තැටිය
2 බ්‍රිතාන්‍ය දූපත් B. අප්‍රිකානු තැටිය
3 කැනරි දූපත් C. ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය
D. යුරේසියානු තැටිය

(1) DCA (2) ADB (3) DBA (4) CDB (..........)

21. ''අ'' ''ආ''

1 සූර්ය බලය A. ලක්ෂපාන
2 .; අඟුරු B. බරුතකන්ද
3 ජල විදුලිය C. අඹේවෙල
D. නොරොච්චෝලෙ


(1) BDA (2) BAD (3) DAB (4) CDA (..........)

22. ''අ'' ''ආ''

1 පොල් වගාව A. මිලිමීටර 300 - 500 වර්ෂාපතනය
2 ඉරිඟු වගාව B. මිලිමීටර 2000 - 2500 වර්ෂාපතනය
3 තේ වගාව C. මිලිමීටර 2000 ට වැඩි වර්ෂාපතනය
D. මිලිමීටර 1900 - 5460 වාර්ෂික වර්ෂාපතනය

(1) ACB (2) DAB (3) BAD (4) BDA (..........)

- **අංක 23 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සිතියම යොදා ගන්න**




23. හෙල් මළු ක්‍රමයට වී වගාව සිදුකරන ප්‍රදේශය අයත් අක්ෂරය කුමක්ද ?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (..........)

24.ජල ගැලීම්වලට භාජනය වීමෙන් බොහෝවිට වගා හානි සිදුවන ප්‍රදේශයට අයත් අක්ෂරය කුමක්ද ?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (..........)

25. ශ්‍රී ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයක් වී වගා කරනු ලබන ප්‍රදේශයට අයත් අක්ෂරය කුමක්ද ?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (..........)

- **ප්‍රශ්න අංක 26 සිට 36 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න**

26. බලශක්තිය නිපදවීම සඳහා යොදා ගන්නා බලශක්ති උත්පාදක ජෛව ස්කන්ධයක් **නොවන්නේ** ?

(1) කෘෂි අපද්‍රව්‍ය (2) ජීව වායුව (3) සුළං (4) දැව (..........)

27. ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන සාධක දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) සූර්යයා හා ජලය (2) පස හා දේශගුණය (3) වියෝජකයින් හා ශාක (4) ජෛව සාධක හා අජෛව සාධක (..........)

28. ජීව විද්‍යාත්මක උපද්‍රවයක් වන්නේ,

(1) නියඟ (2) වසංගත රෝග (3) අකුණු සැර (4) ගිනිකඳු (..........)

29. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව පිහිටා ඇති පොල් පර්යේෂණායතනය පිහිටා ඇත්තේ,

(1) ලුණුවිල (2) මාතලේ (3) හිඟුරක්ගොඩ (4) ඇඹිලිපිටිය (..........)

30. ආග්නේය පාෂාණවලට නිදසුනකි .

(1) .ග්‍රැනයිට් (2) ජිප්සම් (3) දියමන්ති (4) මිනිරන් (..........)

31. ස්වාභාවික සම්පත් අතර පුනර්ජනනීය සම්පතක් වන්නේ,

(1) වාතය (2) සරු පස (3) වනජීවීන් (4) පාෂාණ (..........)

32. මිරිදිය මසුන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,


(1) කාවයියා, සූඩයා, කනයා (2) ඇටවල්ලා, අලගුඩුවා, ලූලා

(3) මස්පෙතියා, කාවයියා, ගොඩයා (4) හුංගා, කනයා, සාලයා (..........)

33. ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල භෞතික ලක්ෂණයක් <u>**නොවන්නේ**</u> කුමක්ද ?

(1) වාරි ඇළ (2) වනාන්තර (3) දිය ඇල්ල (4) ගං මෝය (..........)

- **පහත රූප සටහන උපයෝගී කර ගෙන ප්‍රශ්න අංක 34 සිට 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,**




34. මෙම රූපසටහනේ A-B රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ,

(1) ජල කපොල්ලයි (2) සුළං කපොල්ලයි (3) දිය බෙත්මයි (4) දුර්ගයයි (..........)

35.මෙම රූපසටහනේ C - D රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) උත්තල බෑවුමකි (2) දළ බෑවුමකි (3) අවතල බෑවුමකි (4) මොහොර බෑවුමකි (..........)

36. මෙම රූපසටහනේ E - F රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) නෙරුවකි (2) නිම්නයකි (3) කොත් කන්දකි (4) උත්තල බෑවුමකි (..........)

- **පහත A,B,C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

A - ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
අන්තගාමී දේශගුණ ලක්ෂණ ඇතිවීම

B - උන්නතාංශය
වායු පීඩනය

C - ශ්‍රී ලංකාව දූපතක් වීම
මිරිදිය ධීවර කර්මාන්තය

D - පොසිල ඉන්ධන භාවිතය
පරිසර දූෂණය

37. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීමට හේතුවන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)

38.පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ ද වැඩි වීමට හේතුවන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)

39. දෙවැන්නේ අඩු වීම පළමුවැන්නේ අඩු වීමට හේතුවන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)

40.පළමුවැන්න හා දෙවැන්න අතර සෘජු සම්බන්ධතාවක් නොදක්වන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (..........)

**State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning**

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper**

**අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**(GEOGRAPHY)**

**භූගෝල විද්‍යාව**

# (QUESTION PAPER) - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

**භූගෝල විද්‍යාව - II**

**අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 2 යි**

- **සැලකිය යුතුයි.**
  - **1 කොටස අනිවාර්යය වේ.**
  - **11 කොටස ව්‍යුහගත රචනා ප්‍රශ්න 07 කින් සමන්විත වේ. ඉන් 04 කට පිළිතුරු සැපයිය යුතු වේ.**
  - **එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40 යි.**

1. (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක i සිට iv දක්වා ඇති ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

i. අංක 01 න් දක්වා ඇති භූ ලක්ෂණය කුමක්ද ?

(නිම්නය /නෙරුව / කපොල්ල )

ලකුණු 01

ii. අංක 02 න් දක්වා ඇති බෑවුම් වර්ගය කුමක්ද ?

(උත්තල බෑවුම/ අවතල බෑවුම / මොහොර බෑවුම ) ලකුණු 01

iii. අංක 03 න් දක්වා ඇති භෞතික ලක්ෂණය කුමක්ද ?

(පාෂාණ උද්ගතය / වැලිබිම / හේන ) ලකුණු 01

iv. A ලෙස දක්වා ඇති සිතියම් කොටසේ කැපී පෙනෙන ජලවහන ලක්ෂණය කුමක්ද ? ලකුණු 01


v. B අක්ෂරයෙන් සීමාකර ඇති භූමි කොටසේ සංකේත මගින් දක්වා ඇති පොදු සේවා සපයන ආයතන දෙක නම් කරන්න. ලකුණු 02

vi. C ලෙස දක්වා ඇති ස්ථානයේ නිවැරදි පිහිටීම දක්වන්න. ලකුණු 02

vii. මෙම සිතියම් කොටසේ මධ්‍යයේ ඇති වතු භෝග වගාව නම් කරන්න. ලකුණු 01

viii. මෙම සිතියම පුරා ව්‍යාප්තව ඇති වෘක්ෂලතා වර්ගය කුමක්ද? ලකුණු 01

- **ආ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) යුරෝපය හා ආසියාව වෙන්කර ඇති A, B හා C යන කඳු අතරින් 'යුරල් කඳු වැටිය' දක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F වලින් දක්වා ඇති විසුවියස් ගිනිකන්ද පිහිටා ඇති 'ඉතාලි අර්ධද්වීපය' දක්වෙන අක්ෂරය කුමක් ද?


(iii) ඕස්ට්‍රේලියා මහාද්වීප තටකය තුළ පිහිටි 'තස්මේනියා දූපත් ' H,M හා N යන අක්ෂර අතරින් කවර අක්ෂරයක් වේද ?

(iv) J,K හා P අක්ෂර මගින් දැක්වෙන අක්ෂාංශ අතරින් 'මකර නිවර්තනය ' දක්වෙන අක්ෂරය කුමක් ද?

(v) X, Y හා Z අක්ෂරවලින් දක්වෙන විල් අතරින් 'චැඩ් විල' දක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 05)

- **ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**




(i) අංක 1, 2 හා 3 වලින් දක්වා ඇති ස්ථාන අතරින් ධීවර කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ 'කල්පිටිය අර්ධද්වීපය' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) 'මොණරාගල දිස්ත්‍රික්කය' සඳහා A, B හා C යන අක්ෂර අතරින් කුමක් වේද?

(iii) D, E හා F වලින් දක්වා ඇති අක්ෂර අතරින් 'කොඩ්ඩියාර් බොක්ක' දැක්වෙන අක්ෂරය කුමක් ද?


(iv) J, K හා L යන අක්ෂර අතරින් සංචාරක ආකර්ෂණයක් වූ 'පාසිකුඩා වෙරළ' සඳහා යොදා ඇති අක්ෂරය කුමක් ද?

(v) P, Q හා R යන අක්ෂර අතරින් 'කුරුණෑගල නගරය' දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(ලකුණු 05)

**11 කොටස**

02) i. යාබද රූප සටහනේ අංක 1,2,3 හා 4 න් දක්වා ඇත්තේ පෘථිවි ව්‍යුහයේ ස්ථර හතරකි. ඒවා නම් කරන්න (ල. 2)




ii. ඉහත නම් කළ ස්ථර අතුරින් අංක 1 ලෙස නම් කළ ස්ථරයේ ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කරන්න (ල. 3)

iii. (අ) ශිලා ගෝලයට අයත් ප්‍රධාන කොටස් නම් කරන්න

(ආ) ශිලා ගෝලය මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාරය සාධක දෙකක් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න (ල. 5)


03) i. යාබද දක්වා ඇති ජල චිත්‍රයේ අංක 1,2,3 හා 4 යන අවස්ථා නම් කරන්න (ල.2)

ii. පෘථිවි ජල ගෝලයෙහි ජලය අන්තර්ගතව පවතින ස්වරූප තුනක් සඳහන් කරන්න (ල.3)

iii. මානව කටයුතු සඳහා ජලයේ ඇති වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න (ල.5)

(04)

i. යාබද ශ්‍රී ලංකා වනාන්තර ව්‍යාප්ති සිතියමේ අංක 1,2,3 හා 4 යන වෘක්ෂලතා කලාප ව්‍යාප්තීන් නම් කරන්න (ල.2)




ii. ඔබ ඉහත සඳහන් කළ අංක 1 වනාන්තර සම්බන්ධයෙන් පහත කරුණු තුනට එක් පිළිතුර බැගින් සපයන්න


- ව්‍යාප්තිය
- ප්‍රධාන දේශගුණික ලක්ෂණයක්

ප්‍රධාන දැවමය ශාක වර්ගයක් (ල.3)

iii (අ) ශ්‍රී ලංකාවේ වනාන්තර විනාශවීම කෙරෙහි බලපාන මානව කටයුතු දෙකක් සඳහන් කරන්න

(ආ) ශ්‍රී ලංකාවේ වනාන්තර පද්ධති වලින් ඇති පාරිසරික ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න (ල.5)

(05)





i. ඉහත සිතියමේ 6 හා 10 අංක වලින් දක්වා ඇත්තේ ලෝකයේ තේ වගා කරන ප්‍රධාන රටවල් දෙකකි. ඒවා අනුපිළිවෙලින් නම් කරන්න (ල.2)

ii. සාර්ථක වී වගාවකට අවශ්‍ය ප්‍රධාන භෞතික ලක්ෂණ තුනක් සඳහන් කරන්න (ල.3)

iii. (අ) ආසියාවෙන් බැහැරව වී වගා කරන රටවල් දෙකක් සඳහන් කරන්න

(ආ) ශ්‍රී ලංකාවේ වියළි කලාපීය වී වගාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න (ල.5)

(06)




i. ඉහත දී ඇති ආසියා සිතියම් කොටසේ අංක 1 හා 2 යන අංක වලින් දක්වා ඇති මෝටර් රථ කර්මාන්තයට ප්‍රසිද්ධ රටවල් දෙක අනුපිළිවෙලින් නම් කරන්න (ල.2)

ii. ඉන්දියාවේ මෝටර් රථ කර්මාන්තය ඉතා කෙටි කලකදී වේගවත් දියුණුවක් ලැබීමට බලපෑ සාධක තුනක් සඳහන් කරන්න (ල.3)

iii. මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ පරිසර හිතකාමී නිෂ්පාදන ප්‍රවනතා දෙකක් විස්තර කරන්න (ල.5)

07) i. යම් ජන සංඛ්‍යාවක ව්‍යුහ ලක්ෂණයක් හා සංයුති ලක්ෂණයක් වෙන වෙනම සඳහන් කරන්න (ල.2)

ii. ශ්‍රී ලංකාවේ 2012 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන වාර්තාවට අනුව ඉහළම ජන සංඛ්‍යාවක් වෙසෙන පළාත් තුන අනුපිළිවෙලින් සඳහන් කරන්න (ල.3)

iii. අ) යම් ජන සංඛ්‍යාවක ''වියපත්'' වීම යනුවෙන් කුමක් අදහස් වේද?

ආ) ශ්‍රී ලංකා ජන සංඛ්‍යාවේ මෙම වියපත් ජන සංඛ්‍යාවේ ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. එය සංවර්ධනයේ ප්‍රතිලාභයක් වශයෙන්ද විස්තර කළ හැකිය. නමුත් එම වියපත් ප්‍රතිශතය ඉහළ යාමෙන් ඇතිවිය හැකි සමාජ ආර්ථික ගැටළු දෙකක් කෙටියෙන් විස්තර කරන්න (ල.5)

08) i සංවර්ධනය මැනීම සඳහා විවිධ කාලවලදී භාවිතා කළ සංවර්ධන මිනුම් කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරින් නූතන සංවර්ධන මිනුම් දෙකක් තෝරා නම් කරන්න


1 දළ දේශීය නිෂ්පාදනය 2 ඒක පුද්ගල ජාතික ආදායම 3 ළදරු මරණ අනුපාතිකය

4 උපතේදී ආයු අපේක්ෂාව 5 ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය 6 සාක්ෂරතාව

(ල.2)

ii මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීමේදී යොදාගත් ප්‍රධාන නිර්ණායක තුන නම් කරන්න (ල.3)

iii වර්තමානය වන විට තිරසර සංවර්ධනයක දැඩි අවශ්‍යතාවයක් ඇතිවීමට බලපෑ පාරිසරික ගැටලු දෙකක් නිදසුන් ඇසුරින් විස්තර කරන්න (ල.5)




**1:50,000**

සමෝච්ච රේඛා අන්තරය මීටර් 20

சம உயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440